විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්

**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත**

**மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்**

**PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE**

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல 628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரிய No.628,10th Floor,Jana Jaya City Building,NawalaRoad,Rajagiriya

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | WPC/PSC/REC03/06-i | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | |
| දිනය<br>திகதி<br>Date | 2024.07. 18 | | |

ප්‍රධාන ලේකම් (බ.ප.),
ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
සභා ලේකම්, (බ.ප.),
සියලු අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.)

<u>අයදුම්පත් කැඳවීමේ දින දීර්ඝ කිරීම</u>

පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාග සඳහා අයදුම්පත් කැඳවීමේ දින දීර්ඝ කිරීමට තීරණය කර ඇත. ඒ අනුව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය - **2024.08.02.** වේ. ඒ අනුව මේ වන විටත් පහත සඳහන් තනතුරු සඳහා අයදුම්කිරීමට නොහැකි වූ අයදුම්කරුවන්හට 2024.08.02 දින දක්වා අයදුම්කිරීමට හැකියාව පවතී. එසේම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සලකා බැලීමේ අවසන් දිනය නොවෙනස් වේ. අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ පළ කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

i) සමුපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2023
ii) ග්‍රාම සංවර්ධන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2023
iii) සීමිත පදනම මත ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියට බඳවා ගැනීම - 2023

02. මේ සම්බන්ධයෙන් ඔබගේ කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් සහ ඔබ යටතේ කාර්යාලවල සේවයේ නියුතු නිලධාරීන් කඩිනමින් දැනුවත් කිරීමට කටයුතු කරන්නේනම් මැනවි.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2023 (සීමිත)

බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා පුහුණුකරු තනතුරට අදාල බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ තනතුරු සඳහා පහත සුදුසුකම්ලත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරීන් අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** **වැටුප් පරිමාණය**

වැටුප් කේත අංකය MN-3-2016 වන අතර මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.පරි.ච. 03/2016 අනුව රු. 31,040-10×445-11×660-10×730-10×750-57,550/- වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**03.** **සේවා කොන්දේසි**

(i).මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

(ii).මෙම තනතුරට බඳවාගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් පත් කරනු ලබන දින සිට එක් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ඇත.

(iii).තනතුරට බඳවා ගැනීමෙන් පසු ක්‍රීඩා පුහුණුකරු බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ දැක්වෙන ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් හා රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගවලින් සමත් විය යුතුය.

(iv). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි වලට නොහාත් නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලටද අනුව කටයුතු කල යුතුය.

**04.** **පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන්**

ක්‍රීඩා පුහුණුකරු තනතුරේ පුරප්පාඩු 02ක් සඳහා බඳවා ගැනීම සිදු කරයි. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**4.1** අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2024.07.19** දින වේ. අයදුම්කරන තනතුරට අදාල සියලු සුදුසුකම් **2024.07.19** දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

**05.** **සුදුසුකම්**

**5.1.** **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්**

i) බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ක්‍රීඩා නිලධාරී තනතුරට අදාළව පහත සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

(අ) I. සිංහල/ දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

සහ

I. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් සඳහා සාමාර්ථ ලබාගෙන තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

සහ

II. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් මට්ටමින් (දිස්ත්‍රික් අතර) පැවැත්වෙන තරගයන්හි දී 1 හෝ 2 ස්ථානයන් ලබා තිබීම, ජාතික මහා ක්‍රීඩා උළෙලේ 1, 2 හෝ 3 ස්ථානයන් ලබා තිබීම, ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මඟින් පවත්වනු ලබන ජාතික ශූරතා තරඟවල 1, 2 හෝ 3 ස්ථානයන් ලබා තිබීම.

හෝ

(ආ) I. සිංහල/ දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

සහ

II. දකුණු ආසියාතික තරඟ, ආසියාතික තරඟ, පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟ නියෝජනය කර 1,2,3 ස්ථාන ලබා තිබීම හෝ ඔලිම්පික් තරඟ හෝ ලෝක ශූරතා තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර තිබීම.

සහ

ii) තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ/හය (05/06) මට්ටමේ වන්නා ක්‍රීඩා ක්ෂේත්‍රයට අදළ තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සහ

iii) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිගත් ආයතනයක් විසින් අදාළ ක්‍රීඩාව සඳහා පවත්වනු ලැබූ මාස තුනකට (03) නොඅඩු පුහුණුකරු පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම හෝ ක්‍රීඩා පනත යටතේ අදාළ ක්ෂේත්‍රයට නියමිත ක්‍රීඩා සංගමය විසින් නිකුත් කරන ලද පුහුණුකරු බලපත්‍රයක් ලබා තිබීම.

**5.2.** කායික සුදුසුකම්

සෑම අයදුම්කරුවෙක්ම බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**5.3.** වෙනත් සුදුසුකම්

i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.
iii. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා තිබීම.
iv. පාලන චක්‍රලේඛ අංක 04/2021 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
v. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනට පෙරාතුව වූ වසර පහ (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
vi. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට අනු අංක 05 යටතේ දක්වා ඇති සියළුම සුදුසුකම් සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබිය යුතුය.

**5.4** පළපුරුද්ද

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා නිලධාරී තනතුරේ ස්ථිර කරන ලද, වසර අටක (08) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ වැටුප් වර්ධක අටක් (08) උපයාගෙන ඇති නිලධාරියෙකු වීම.

**06.** **වයස් සීමාව**

අවම සීමාව : දැනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරන්නන්ගෙන් බඳවාගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ.

**07.** **බඳවා ගැනීමේ ක්‍රමය**

සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර ඉන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ. ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ පහත පරිදි වේ.

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|
| අතිරේක සේවා කාලය | 30 |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 |
| ක්‍රීඩා නිලධාරී තනතුරේ දක්වන ලද දක්ෂතා | 20 |
| ක්‍රීඩා තරඟ විනිශ්චය/ තරඟ සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද | 20 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතා | 05 |
| එකතුව | 100 |

( ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ ඇමුණුම 01හි දක්වා ඇත. )

08. අයදුම් කිරීමේ ක්‍රමය

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් A 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමු පිටුවටද, අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2024.07.26** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2023**" යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. අයදුම්පත් ලද බව දන්වනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පත් හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති හෝ අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. **සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම:**

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුරදී හෝ සම්මුඛ පරීක්ෂණයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

**15.** මෙම සම්මුඛ පරීක්ෂණය මඟින් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

**17.** මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන / නොවන ඕනෑම කරුණක් පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

**18.** නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරඟ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දි අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

**19.** මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත
2024.06. 29

# ආදර්ශ අයදුම්පත්‍රය

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2023 (සීමිත)

විභාග අංකය [ ] (කාර්යාලීය ප්‍රයෝජන සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E

**01.** 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -........................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):
..........................................................................................................................................
(උදා: H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම(සිංහලෙන්/දෙමළෙන්)-..................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**02.** 2.1 ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ..........................................................................................
..........................................................................................................................................

2.2 ස්ථිර ලිපිනය(සිංහලෙන්/දෙමළෙන්): ..........................................................................................
..........................................................................................................................................

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය:
i. සිංහලෙන්/දෙමළෙන්- ..........................................................................................
..........................................................................................................................................
ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින්- ..........................................................................................
..........................................................................................................................................

2.4 දුරකථන අංකය :

ස්ථාවර: [ | | | | | | | | | ] ජංගම: [ | | | | | | | | | ]

❖ මෙ සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මඟින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න.

**03.** 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

ස්ත්‍රී [ ] පුරුෂ [ ]

3.2 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය - කොළඹ -1 [ ]
ගම්පහ - 2
කළුතර - 3 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය-..........................................................................................

3.4 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව-..........................................................................

**04.** 4.1 විවාහක/අවිවාහක බව - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

විවාහක ☐ අවිවාහක ☐

4.2 උපන් දිනය වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

4.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු: ☐☐ මාස: ☐☐ දින: ☐☐

**05.** අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තරය:

i. විභාගයේ වර්ෂය හා මාසය: වර්ෂය- ☐☐☐☐ මාසය- ☐☐
ii. විභාග අංකය: .....................
iii. ප්‍රතිඵල:

| විෂය | සාමාර්ථය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|
| 1 | | 6 | |
| 2 | | 7 | |
| 3 | | 8 | |
| 4 | | 9 | |
| 5 | | 10 | |

5.2 අ.පො.ස.(උ.පෙළ) විභාගය පිළිබඳව විස්තරය:

i. විභාගයේ වර්ෂය හා මාසය: වර්ෂය- ☐☐☐☐ මාසය- ☐☐
ii. විභාග අංකය: .....................
iii. ප්‍රතිඵල:

| විෂය | සාමාර්ථය |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |

**06.** අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 5.1 අනුව ලබා ඇති වෘත්තීය සුදුසුකම්

i) ..........................................................................................................................

ii) ..........................................................................................................................

iv) ..........................................................................................................................

**07.** අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අනු අංක 07 අනුව ලබා ඇති සුදුසුකම්

i) අතිරේක සේවා කාලය
..........................................................................................................................
..........................................................................................................................

ii) අතිරේක අධ්‍යාපන සුදුසුකම්
..........................................................................................................................
..........................................................................................................................

iii) ක්‍රීඩා නිලධාරී තනතුරේ දක්වන ලද දක්ෂතා
..........................................................................................................................
..........................................................................................................................

iv) ක්‍රීඩා තරග විනිශ්චය/ තරග සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද
..........................................................................................................................

08. දැනටමත් ක්‍රීඩා නිලධාරී තනතුරේ යෙදී සිටින ඔබ,

8.1 සේවා ස්ථානයේ නම සහ ලිපිනය :
..........................................................................................................................

8.2 එම තනතුරට පත්වීමේ දිනය :
..........................................................................................................................

8.3 එම තනතුර ස්ථිරද, නැතිද යන්න :
..........................................................................................................................

8.4 ස්ථිර නම්, සේවය ස්ථිර කල දිනය :
..........................................................................................................................

09. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාල කොටුවේ √ ලකුණ යොදන්න) ඔව් ☐ නැත ☐

"ඔව්" නම් විස්තර සඳහන් කරන්න: ..........................................................................................

10. <u>අයදුම්කරුගේ සහතිකය</u>

..........................................................................................................................
.......................................................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමූපකාර සංවර්ධන නිලධාරී III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය ........................ ...............................................
අයදුම්කරුගේ අත්සන

11. <u>ආයතන ප්‍රධානියාගේ සහතිකය</u>
( අනවශ්‍ය වචන කපා හරින්න)

............................................................... මහතා/මිය/මෙනවියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව .......................... දින සිට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා නිලධාරී තනතුරක සේවය කරන බවත් එම තනතුරේ 2024.06.30 දිනට ...................... සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/නොමැති බවත්, පූර්වාසන්න වසර 05 තුල සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති/නොමැති බවත්, වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇති/නැති බවත්, ඔහුට /ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති/ඇති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති/ඇති බවත් සහතික කරමි. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බව සහතික කරන අතර අදාල බඳවා ගැනීමේ පටිපාටිය අනුව මෙම නිලධාරියා/ නිලධාරිනිය සුදුසුකම් සපුරා ඇති බව ද නිර්දේශ කරමි.

දිනය ................................ ...............................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

සම්මුඛ පරීක්ෂනය සහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | | ලබාදිය යුතු උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| අතිරේක සේවා කාලය | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අදාල පාලන චක්‍රලේඛ 01/2022 හි අනු අංක 03 අනුව ලකුණු ලබා දීම සිදු කරයි. | | 30 |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | I. රජයේ පිළිගත් ආයතනයක් මගින් පවත්වනු ලබන ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපන හෝ ක්‍රීඩා කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳව සති දෙකකට (02) වඩා වැඩි පාඨමාලා (එක් පාඨමාලාවකට ලකුණු 3 බැගින් උපරිම පාඨමාලා 2ක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 6 | 25 |
| | II. රජයේ පිළිගත් ආයතයක් මගින් පවත්වනු ලබන ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපන හෝ ක්‍රීඩා කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳව මාස හයකට (06) නොඅඩු පාඨමාලා (එක් පාඨමාලාවකට ලකුණු 4 බැගින් උපරිම පාඨමාලා 2ක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 8 | |
| | III. රජයේ පිළිගත් ආයතනයක් මගින් පවත්වනු ලබන ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපන හෝ ක්‍රීඩා කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳව වසරක් හෝ ඊට වැඩි පාඨමාලා ( එක් පාඨමාලාවක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 15 | |
| | IV. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගත් ආයතනයක් හෝ විශ්වවිද්‍යාලයක් මගින් ලබා ඇති ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය හෝ ක්‍රීඩා කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳ උපාධිය | 25 | |
| | සැ.යු. පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ක්‍රීඩා නිලධාරී තනතුරට අදාළව 7.2.2.1 යටතේ වන සංලක්ෂයෙහි සඳහන් ක්‍රීඩා ඩිප්ලෝමා අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා හදාරා ඇති පාඨමාලා සඳහා මෙහිදී ලකුණු දෙනු ලැබේ. | | |
| | ( ඉහත සුදුසුකම්වලින් ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු දෙනු ලැබේ.) | | |
| | I. පූර්වාසන්න වසර තුන (3) ඇතුළත දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේදී විධිමත් පරිදි තමා වෙත රාජකාරී පවරා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි ජයග්‍රහණය වෙනුවෙන් දක්වන ලද සක්‍රීය දායකත්වය | 8 | |
| | a ) දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේ සමස්ථ ශූරතාවය දිනා ගැනීම | 8 | |
| | b ) දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේ සමස්ථ අනුශූරතාවය දිනා ගැනීම | 6 | |
| | c ) දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේ මලල ක්‍රීඩා ශූරතාවය දිනා ගැනීම | 6 | |
| | d ) දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේ මලල ක්‍රීඩා අනුශූරතාවය දිනා ගැනීම | 4 | |
| | e ) දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේ කණ්ඩායම් තරග ශූරතාවය දිනා ගැනීම | 6 | |
| | f ) දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලේ කණ්ඩායම් තරග අනුශූරතාවය දිනා ගැනීම | 4 | |
| | ( පූර්වාසන්න වසර තුන ඇතුළත ලබා ඇති ඉහළම ජයග්‍රහණය සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | | |

| | | | | |
|---|---|---|---|---|
| ක්‍රීඩා නිලධාරී තනතුරේ දක්වන ලද දක්ෂතා | II. පූර්වාසන්න වසර 5ක් තුළ ක්‍රීඩා නිලධාරියෙකු ලෙස විධිමත් පරිදි තමා වෙත රාජකාරී පවරා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ක්‍රීඩා කටයුතු ප්‍රවර්ධනය වෙනුවෙන් නිර්මාණාත්මකව ක්‍රියාත්මක කල නව වැඩසටහන්<br><br>( මෙය සනාථ කිරීම සඳහා ශ්‍රව්‍ය, දෘශ්‍ය, ලිඛිත හෝ ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් අදාල තොරතුරු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය. | | 8 | 20 |
| | III. ක්‍රීඩා සමාජ පිහිටුවීම<br><br>පූර්වාසන්න වසර 3 තුළ විධිමත් පරිදි තමා වෙත රාජකාරී පවරා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාවෙන් 75%ක වසම් ප්‍රමාණයක ක්‍රියාකාරී ක්‍රීඩා සමාජ පිහිටුවා තිබීම.<br><br>( ඉහත කරුණු සංඛ්‍යා ලේඛන සහිතව ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කල ලිපියක් මගින් තහවුරු කල යුතුය. | | 4 | |
| ක්‍රීඩා තරඟ විනිශ්චය/ තරග සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද | I. බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය හැර වෙනත් රාජ්‍ය ආයතනයක් මගින් පැවැත්වූ ක්‍රීඩා තරගයක තරග සංවිධාන කටයුතු භාරව කටයුතු කිරීම<br><br>( මෙය අදාල රාජ්‍ය ආයතනයෙන් නිකුත් කරනු ලබන ලිපියක් මගින් තහවුරු කළ යුතුය. ) | | 10 | 20 |
| | II. තරග විනිශ්චය | | 10 | |
| | a ) ජාතික මට්ටමින් ක්‍රීඩා පුහුණුකරුවකු හෝ පරිපාලකයෙකු හෝ සංවිධායකවරයෙකු හෝ විනිශ්චයකරුවකු ලෙස කටයුතු කිරීම | 5 | | |
| | b ) දකුණු ආසියාතික මට්ටමින් ක්‍රීඩා පුහුණුකරුවකු හෝ පරිපාලකයෙකු හෝ සංවිධායකවරයෙකු හෝ විනිශ්චයකරුවකු ලෙස කටයුතු කිරීම. | 8 | | |
| | c ) ආසියාතික/පොදු රාජ්‍ය මණ්ඩලීය ලෝක ශූරතා ඔලිම්පික් මට්ටමින් ක්‍රීඩා පුහුණුකරුවකු හෝ පරිපාලකයෙකු හෝ සංවිධායකවරයෙකු හෝ විනිශ්චයකරුවකු ලෙස කටයුතු කිරීම | 10 | | |
| | මෙම කරුණු සනාථ කිරීම සඳහා විධිමත් තහවුරු කිරීම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.<br><br>ඉහත සුදුසුකම්වලින් ඉහළ ම සුදුසුකම සඳහා පමණක් ලකුණු දෙනු ලැබේ. | | | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | | | | 5 |
| එකතුව | | | | 100 |